... ප්‍රාන්ත අධිකාරිණය

3 0 ... 1987

අනුරාධපුරය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 24 දරන
# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 මැයි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 3.30 තැපැල් ගාස්තුව : රු. 2.30 යි.

## 1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 මැයි මස 15 වන දින.]

එල්. ඩී.—ඕ. 12/87.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය

1. මේ පනත 1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

262 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) ශ්‍රී ලංකාවේ එක් එක් දිස්ත්‍රික්කය සඳහා තේරීම් භාර නිලධරයා වශයෙන් හෝ එලෙස ක්‍රියා කිරීමට හිමි සුදුසු තැනැත්තකු ද සහකාර තේරීම් භාර නිලධරයන් වශයෙන් හෝ එලෙස ක්‍රියා කිරීමට එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් ද නමින් හෝ ධූරයෙන් පත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇඇ) වෙනත් යම් පළාත් පාලන ආයතනයක හෝ 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත යටතේ පිහිටුවන ලද සංවර්ධන සභාවක සභිකයකු වූයේ නම් හොත් ; හෝ"

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්—

"(3) (1) වන උපවගන්තියේ සහ (2) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මහ නගර සභාවක නගරාධිපති ධූරයෙන් හෝ සභික ධූරයෙන්, යම් සංවර්ධන සභාවක හෝ යම් නගර සභාවක හෝ යම් ප්‍රාදේශීය සභාවක සභාපති ධූරයෙන් හෝ සභික ධූරයෙන්, අවස්ථාවෝචිත පරිදි, මහ නගර සභා ආඥාපනතේ 277 වන

වගන්තිය යටතේ හෝ සංවර්ධන සභා පනතේ 68 වන වගන්තිය යටතේ හෝ නගර සභා ආඥා පනතේ 184 වන වගන්තිය යටතේ හෝ ප්‍රාදේශීය සභා පනතේ 179 වන වගන්තිය යටතේ හෝ පළ කරනු ලැබූ නියමයක් මගින්, නියමිත දිනයට පසු යම් අවස්ථාවක ඉවත් කරනු ලැබූ කිසිම තැනැත්තකු, ඒ ධුරයෙන් ඉවත් කරනු ලැබීමේ දින සිට අවුරුදු පහක කාලසීමාවක් සඳහා මේ ආඥාපනත යටතේ තෝරා පත්කර ගනු ලැබීමට හෝ යම් පළාත් පාලන ආයතනයක අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

'ඡන්ද විමසීම පැවැත්වීමේ කාලය.

25. පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් වූ හැම මහා ඡන්ද විමසීමක් ම, තෝරා පත්කර ගනු ලැබිය යුතු සභිකයන්ගේ ධුර කාලය ආරම්භවීමට නියමිතව ඇත්තේ යම් දිනයක ද ඒ දිනයට ඉහතින් වූ මාස හයක කාල සීමාවක් ඇතුළත පවත්වනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ "දැන්වීම පළකරන ලද දිනයට පසුව එළඹෙන දිනයෙහි ආරම්භ විය යුතු අතර" යන වචන වෙනුවට "දැන්වීම පළකරන ලද දිනයට පසුව එළඹෙන දහතරවන දිනයෙහි ආරම්භ විය යුතු අතර" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"තේරීම් භාර නිලධරයන් පත් කිරීම.

27. (1) යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ හැම මහා ඡන්ද විමසීමක කාර්යය සඳහා ඒ ඡන්ද විමසීම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, තේරීම් භාර නිලධරයකුට හෝ සහකාර තේරීම් භාර නිලධරයකුට පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන්කර දෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටුකිරීමට ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා තේරීම් භාර නිලධරයා වශයෙන් රජයේ නිලධරයකු සහ සහකාර තේරීම් භාර නිලධරයන් වශයෙන් අවශ්‍ය පරිදි රජයේ නිලධරයන් යම් සංඛ්‍යාවක් කොමසාරිස්වරයා විසින් නම් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද තේරීම් භාර නිලධරයකු අසනීපවීමේ හේතු වෙන් හෝ වෙනත් හේතුවක් නිසා, මේ ආඥා පනතින් හෝ ඒ යටතේ ඔහුට පවරා දෙන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, ඒ තේරීම් භාර නිලධරයා විසින්, ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය වෙනත් රජයේ නිලධරයකුට පවරා දෙන ලැබිය හැකි ය. එවැනි සෑම පවරාදීමක් ම, හැකි ඉක්මණින් කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු අතර, ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය පවරා දෙනු ලැබවේ යම් රජයේ නිලධරයකුට ද, ඒ රජයේ නිලධරයා විසින් එවකටත් කරන ලද යම් දෙයක වලංගු භාවයට හානියක් නොමැතිව, කොමසාරිස් වරයා විසින්, ඒ පැවරීම ස්ථිර කළ හැකි ය. නැත හොත් ඊට අවසර දෙනු නොලැබිය හැකි ය.

(3) මේ වගන්තියෙන් තේරීම් භාර නිලධර යකුට පවරන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය 4 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් තේරීම් භාර නිලධරයකු විසින්, තම දිස්ත්‍රික්කය ඇතුළත වූ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක දී ක්‍රියාත්මක කළ හැකි ය. නැතහොත් ඉටු කළ හැකි ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සභික සංඛ්‍යාවට සමාන" යන වචන සිට "ප්‍රමුඛත්වය අනුව දක්වමින්" තෙක් වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"ඒ පළාත් පාලන ආයතනය සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාවට සමාන වන අපේක්ෂක සංඛ්‍යාවට තුනක් වැඩි සංඛ්‍යාවක් නම් දක්වමින්";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(5) එක් එක් නාම යෝජනා පත්‍රය පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයා විසින් අත්සන් කළ යුතු අතර, ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විටක, (මෙහි මින්මතු "කණ්ඩායම් නායකයා" යනුවෙන් සඳහන් කරනු ලබන)

ඒ කණ්ඩායමේ කණ්ඩායම් නායකයා වශයෙන්, ඒ කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයෙහි නම ඇතුළත්වෙන සහ එලෙස එහි නාමෝද්දිෂ්ට අපේක්ෂකයා විසින් අත්සන් කළ යුතු ය. තව ද, එය සමාදාන විනිශ්චයකාර වරයකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් හෝ සහතික කළ යුතු ය.

තවද, පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට ඒ පක්ෂයේ ලේකම් හෝ බලයලත් නියෝජිතයා විසින් ද ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට කණ්ඩායම් නායකයා විසින්ද, ඒ නාම යෝජනා පත්‍රය, නාම යෝජනා කිරීමේ කාල සීමාව තුළදී, තේරීම් භාර නිලධරයා වෙත භාර දිය යුතුය.";

තවද

(3) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.**

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කිරීම අතර කාලය තුළ, ඒ ස්වාධීන කණ්ඩායමේ" යන වචන වෙනුවට "නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කිරීම අතර කාලය තුළ (සහ කුමන හේතුවක් නිසා වුවද, නාම යෝජනා කිරීමේ කාලසීමාවේ අවසන් දිනට ඉහතින් ම වූ දින මධ්‍යාහ්න 12.00 පසු නොවී) ඒ ස්වාධීන කණ්ඩායමේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.**

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) නාම යෝජනා පත්‍රයක් හෝ පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පසු, ඡන්ද විමසීම සඳහා එක් පිළිගත් දේශපාලන පක්ෂයක පමණක් හෝ එක් ස්වාධීන කණ්ඩායමක පමණක් අපේක්ෂකයන් නාම යෝජනා කරනු ලැබ ඇති අවස්ථාවක, තේරීම් භාර නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාලයක් ඇතුළත, ඒ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා සහ වෙනත් සභිකයන් වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කළ යුත්තේ ඒ නාමයෝජනා පත්‍රයේ නම් දැක්වෙන අපේක්ෂකයන්ගේ නම් වලින් කවර නම්දැයි තීරණය කිරීමට ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ඒ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාට තේරීම් භාර නිලධරයා විසින් නියම කළ යුතු ය. තේරීම් භාර නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය ඇතුළත ඒ ලේකම්වරයා විසින් හෝ කණ්ඩායම් නායකයා විසින්, තම තීරණය තේරීම් භාර නිලධරයාට දන්වනු ලැබුවහොත්, ඒ තීරණයෙහි නිශ්චිතව සඳහන් පිළිවෙළින් වූ අපේක්ෂකයන් ඒ

පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා සහ වෙනත් සභිකයන් වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ බව තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශ කළ යුතු ය. අනෙක් අතට ඒ ලේකම්වරයා විසින් හෝ කණ්ඩායම් නායකයන් විසින් හෝ තේරීම් භාර නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද කාලය ඇතුළත නාම තීරණය තේරීම් භාර නිලධරයාට දැන්වීමට පැහැර හැරියහොත්, එවිට—

(i) එම නාම යෝජනා පත්‍රයේ පළමුව හා දෙවනුව නම් දැක්වෙන අපේක්ෂකයන් පිළිවෙළින් නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගනු ලැබූ බව තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශ කළ යුතු ය; තව ද

(ii) එම පළාත් පාලන ආයතනයට තෝරා පත්කර ගනු ලැබූ සභිකයන්ගේ සංඛ්‍යාවට සමාන අනෙක් අපේක්ෂකයන් එම නාම යෝජනා පත්‍රයේ ඔවුන්ගේ නම් සඳහන් වී ඇති අනුපිළිවෙළ අනුව, සභිකයන් ලෙස තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කළ යුතු ය. ".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ආ) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ, සිංහල අකාරාදී පිළිවෙළින් (අපේක්ෂකයන් විසින් දක්වා ඇති පරිදි) අපේක්ෂකයන්ගේ නම් ඒ එක් එක් අපේක්ෂකයාට වෙන් කර දෙන ලැබූ අනුක්‍රමික අංකය, ඒ පක්ෂයට හෝ කණ්ඩායමට වෙන් කර දෙන ලද අනුමත ලකුණ ද, ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වූ විට " ස්වාධීන කණ්ඩායම " යන වචන සහ යම් හඳුනා ගැනීමේ අංකයක් වෙතොත් ඒ අංකය., තව ද

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ " දින දහ හතරකට අඩු නොවන නැතහොත් එදින සිට දින විසි අටකට වැඩි නොවන " යන වචන වෙනුවට, " සති පහකට අඩු නොවන නැතහොත් එදින සිට සති හතකට වැඩි නොවන " යන වචන ආදේශ කිරීමෙන්.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය " ඔවුන්ගේ නම් දැක්වෙන පිළිවෙළින් " යන වචන අත්හැරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39ආ වන වගන්තිය ඇතුළත් කිරීම.

**13.** 39අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 39ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"තැපෑලෙන් ඡන්දය දීම.

39ආ. (1) යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීමක කාර්යය සඳහා මේ වගන්තිය යටතේ තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලැබූ තැනැත්තකු විසින් තැපෑලෙන් ඡන්දය දිය හැකි අතර ඒ ඡන්ද විමසීමේ දී ඔහු පෞද්ගලිකව ඡන්දය නොදිය යුතු ය.

මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩ කරමින් යම් ඡන්ද විමසීමක දී පෞද්ගලිකව ඡන්දය දෙන. යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් පළාත් පාලන ආයතනයක තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම සඳහා වන ඉල්ලීමක්—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු විසින් හෝ පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, තැපැල් දෙපාර්තමේන්තුවේ සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ තමා එවැනි සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු වශයෙන් සේවයෙහි නියුක්තව සිටීම හා සම්බන්ධ විශේෂ අවස්ථානුගත කරුණු නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව ඡන්දය දීමට තමාට නොහැකි වන බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව හේතු කොට ගෙන ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා විසින්;

(ආ) ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයේ දී ඡන්ද විමසීම හා සම්බන්ධ කාර්යයන් සඳහා තමාගේ සේවා නියුක්තියට අදාළ විශේෂ අවස්ථානුගත කරුණු නිසා, නැතහොත් ඒ කාර්යය සඳහා තමා සේවයෙහි නියුක්ත කරනු ලැබීමට ඉඩ ඇති බව හේතු කොටගෙන රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ පළාත් පාලන සේවයේ හෝ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු විසින් ; සහ

(ඇ) වෙනත් යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක තම අපේක්ෂකත්වය නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව ඡන්දය දීමට තමාට නොහැකි වන බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව හේතු කොටගෙන ඡන්ද විමසීමේ අපේක්ෂකයකු විසින්

කරනු ලැබිය හැකි ය.

(3) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමක්, 26 වන වගන්තිය යටතේ නාම යෝජනා කිරීම පිළිබඳ දැන්වීම පළ කරනු ලැබූ දිනයට පසු දින දහයක් ඇතුළත ලැබෙන පරිදි තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ ඉල්ලීම තව වන උපලේඛනයෙහි ඇතුළත් නියෝග මගින් ඒ කාර්යය සඳහා නියම කර ඇති ආකාරයට සාරානුකූල විය යුතු ය.

(4) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන කිසිම ඉල්ලීමකට, ඉල්ලීම මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූල බවට තේරීම් භාර නිලධරයා සෑහීමට පත් වුවහොත් මිස, ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(5) තැපැල් ඡන්දදායකයන් වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සළකා බැලීමේ කාර්ය සඳහා, තේරීම් භාර නිලධරයා විසින්, ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් තොරතුරක් තමා වෙත සපයන ලෙස දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කළ හැකි ය.

(6) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලැබූ ඉල්ලීමක් සම්බන්ධයෙන් තේරීම් භාර නිලධරයකුගේ තීරණය ඉල්ලුම්කරු වෙත ලියවිල්ලකින් දැන්විය යුතු ය.

(7) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමකට ඉඩ දෙමින් හෝ නොදෙමින් කරනු ලබන තේරීම් භාර නිලධරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(8) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමකට තේරීම් භාර නිලධරයකු විසින් ඉඩ දෙනු ලැබූ අවස්ථාවක, ඡන්ද විමසීමක කාර්යය සඳහා ඉල්ලුම්කරු තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු විය යුතු ය.

(9) තේරීම් භාර නිලධරයා විසින් තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් එක් එක් තැනැත්තා වෙත, ඒ තැනැත්තා විසින් සපයන ලද ලිපිනයට —

(අ) ඡන්ද පත්‍රිකාවක් ;

(ආ) අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතියක් ;

(ඇ) මේ උපවගන්තියේ (ඈ) ඡේදයෙහි සඳහන් ලියුම් කවරයට වඩා කුඩා විය යුතු වූ ද "ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යන්න සහ ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවෙහි මුද්‍රණය කර ඇති අංකය ලකුණු කළා වූ ද තැපැල් ඡන්ද පත්‍රිකාව විධිමත් ලෙස ලකුණු කොට එය නැවත එවනු ලබන විට එය බහාලිය යුතු වූ ද ලියුම් කවරයක් ; සහ

(ඈ) ඉහත සඳහන් ලේඛන ආපසු යවනු ලැබීම පිණිස ලියුම් කවරයක්

හැකිතාක් ඉක්මණින් තැපැලෙන් යවනු ලැබිය යුතු ය.

(10) තැපැල් ඡන්දදායකයන් ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් තැනැත්තන් විසින් පාවිච්චි කළ යුතු ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය හා අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඒවා නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය මේ පනතේ තුන්වන උපලේඛනයෙහි ඇතුළත් නියෝග අනුව විය යුතු ය.

(11) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් තැනැත්තකු වෙත නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකාවක් මේ ආඥාපනතෙහි "තැපැල් ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(12) ඡන්ද විමසීමක් පැවැත්වීමට ඇති යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක තේරීම් භාර නිලධරයා විසින් ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් සෑම තැනැත්තකුගේ ම ඡන්ද හිමි නාම ලේඛනයෙ සඳහන් නම, ලිපිනය සහ අංකය දැක්වෙන (මේ ආඥාපනතේ "තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ලැයිස්තුවක් හැකිතාක් ඉක්මණින් පිළියෙල කළ යුතු ය. නව්වන උපලේඛනයෙහි ඇතුළත් නියෝග මගින් ලැයිස්තුව පිළියෙල කිරීම සම්බන්ධයෙන් නියම කර ඇති යම් ආකාරයකින් ඒ ලැයිස්තුව පිළියෙල කරනු ලැබිය යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

" ඡන්දය දීමේ කාලය.

41. යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා වූ සෑම ඡන්ද විමසීමක ම ඡන්දය දීම, 38 වන වගන්තිය යටතේ දැන්වීමක් මගින් තත් කාර්යය සඳහා නියම කරන ලද දිනයේ පෙ. ව. 7.00 ට ආරම්භ කළ යුතු අතර, එදින ප. ව. 4.00 ට අවසන් කළ යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (අ) පළාත් පාලන ආයතනයේ සභිකයන් වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා වන, එක් එක් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ (අපේක්ෂකයන් විසින් දක්වා ඇති පිළිදි) අපේක්ෂකයන්ගේ නම් සිංහල අකාරාදි අනුපිළිවෙළට ද ඒ එක් එක් අපේක්ෂකයාට වෙන් කර දී ඇති අනුක්‍රමික අංකය ද ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම සඳහා වෙන් කර දී ඇති අනුමත කරන ලද ලකුණ ද සමග, එක් එක් පිළිගත දේශපාලන පක්ෂයේ නම හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට එක් එක් කණ්ඩායම සඳහා "ස්වාධීන කණ්ඩායම" යන වචන සහ ඒ කණ්ඩායම වෙනුවෙන් වෙන් කර ඇති හඳුනා ගැනීමේ අනුක්‍රමික අංකය ද දැක්වෙන දැන්වීමක්, ඡන්ද පොළෙන් පිටත

ප්‍රදර්ශනය කරනු ලැබීමට සැලැස්විය යුතු ය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (අ) ඡේදයෙහි "ඒ කණ්ඩායමේ හඳුනා ගැනීමේ අංකය ද" යන වචන වෙනුවට, "ඒ කණ්ඩායමේ හඳුනා ගැනීමේ අංකය සහ මෙයට පහළින් ම, පළාත් පාලන ආයතනයට තෝරා පත් කර ගනු ලැබිය යුතු සභික ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

යන් සංඛ්‍යාවට සමාන වන සංඛ්‍යාවට තුනක් එකතු කොට, අනුක්‍රමික පිළිවෙළට සකස් වූ යම් සංඛ්‍යාවක් " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ (1) වන උප වගන්තියේ " ඡන්ද විමසීම පවත්වනු ලැබූ ඡන්ද පොළේ " යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 59අ වගන්තිය ඇතුළත් කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම වගන්තියේ 59අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" ගණන් කිරීමේ නිලධරයෝ.

59අ. (1) කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ඡන්ද ප්‍රදේශයක එක් එක් තේරීම් භාර නිලධරයා විසින් එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීම භාරව කටයුතු කිරීම සඳහා ගණන් කිරීමේ නිලධරයකු ද ඒ ගණන් කිරීමේ නිලධරයාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා ඔහුට සහාය වීම පිණිස අවශ්‍ය සහායකයන්, ලිපිකරුවන් සහ වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් ද පත් කළ යුතු අතර ඔහු විසින් ඒ පත්වීම් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(2) සුදුසු යයි තේරීම් භාර නිලධරයා සල්පනා කරන්නේ නම්, ඔහු විසින් ගණන් කිරීමේ නිලධරයකුගේ කාර්ය ඉටු කළ හැකි අතර ගණන් කිරීමේ නිලධරයකු සම්බන්ධයෙන් වූ මේ ආඥාපනතේ විධිවිධාන ඒ තේරීම් භාර නිලධරයාට අදාළ විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (1) වන උප වගන්තියේ " ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු ලබන වේලාව සහ ස්ථාන පිළිබඳ " යන වචන වෙනුවට " ඡන්ද ගණන් කිරීම ආරම්භ කරනු ලබන වේලාව සහ ගණන් කිරීමේ මධ්‍යස්ථාන සහ ඒ එක් එක් මධ්‍යස්ථානයට වෙන් කරන ලද ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් පිළිබඳ " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 61අ වගන්තිය ඇතුළත් කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 61අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම.

61අ. යම් ඡන්ද ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ තැපැල් ඡන්ද පත්‍රිකා නවවන උපලේඛනයේ දක්වා ඇති නියෝගවලට අනුකූලව, වෙනම ඇති ගණන් කිරීමේ මධ්‍යස්ථානයක දී හෝ තේරීම් භාර නිලධරයා විසින් නිශ්චය කරන ලැබිය හැකි එවැනි මධ්‍යස්ථාන ගණනක දී ගණන් කරනු ලැබිය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) ලකුණු නොකරන ලද හෝ ඡන්දය දෙනු ලැබූ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම කවරක් ද යන්න පිළිබඳ අවිනිශ්චිතතාවය නිසා අවලංගු වන හා වූ හෝ යම් ඡන්ද පත්‍රිකාවක";

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(6) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳවී වචනයෙන් මෙන්ම ඉලක්කමෙන් වූ ලිඛිත ප්‍රකාශයක් ද, ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද නාම අපේක්ෂකයකුම සඳහා දක්වා ඇති මනාප සංඛ්‍යාව පිළිබඳව වචනයෙන් මෙන්ම ඉලක්කමෙන් වූ වෙනම ලිඛිත ප්‍රකාශයක් ද ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය. තවද, ඒ එක් එක් ප්‍රකාශය ගණන් කිරීමේ නිලධරයා විසින් සහතික කරනු ලැබිය යුතු අතර, ඔහුගේ සහායකයන් සහ ලිපිකරුවන් අතුරින් එක් කෙනෙකු විසින් ද පැමිණ සිටින හා අත්සන් කිරීමට කැමැත්තක් දක්වන යම් පක්ෂයක හෝ කණ්ඩායමක ගණන් කිරීමේ නියෝජිතයන් විසින් ද ඊට සාක්ෂි වශයෙන් අත්සන් තබනු ලැබිය යුතු ය.".

(3) (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උප වගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(6අ) ඡන්දදායකයකු විසින්, පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් තුන් දෙනකුට වැඩි සංඛ්‍යාවක් සඳහා සිය මනාප සඳහන් කරනු ලැබ ඇත්තේ නම්, ඔහුගේ ඡන්ද පත්‍රිකාවේ සඳහන් කර ඇති මනාප නොසලකා හරිනු ලැබිය යුතු ය.

(6ආ) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු සඳහා ඡන්දදායකයකු විසින් සිය ඡන්ද පත්‍රිකාවේ එක් මනාපයකට වැඩි මනාප ගණනක් සඳහන් කරනු ලැබ ඇති අවස්ථාවක, එසේ සඳහන් කර ඇති සියලු මනාප එක් මනාපයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6ඈ) ඡන්දදායකයකු විසින් ඔහුගේ ඡන්ද පත්‍රිකාවේ දක්වා ඇති මනාපය කවර අපේක්ෂකයකු සඳහා දැයි අවිනිශ්චිතභාවය නිසා අවලංගු වන කල්හි එය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (i) වන උපවගන්තියේ "යළි ඡන්ද පොළක" යන වචන අත්හැරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව" යන වචන වෙනුවට, "ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව ද ඒ එක් එක් පක්ෂය විසින් හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගන්නා ලද මනාප සංඛ්‍යාව ද" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය සහ (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:—

"(ආ) දී ඇති ඡන්ද සංඛ්‍යාව සහ මනාප පිළිබඳ ප්‍රකාශවලින්, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට දී ඇති ඡන්ද සංඛ්‍යාව ද, ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයාට දක්වනු ලැබ ඇති මනාප සංඛ්‍යාව ද තේරීම් භාර නිලධරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය;

(ඇ) තේරීම් භාර නිලධරයා විසින් (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සහ (ඉ) ඡේදයෙහි සඳහන් කරන ප්‍රකාශ වලින් පසු, වැඩීම ඡන්ද සංඛ්‍යාවක් දිනා ලැබ ඇති පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාගෙන් හෝ, තේරීම් භාර නිලධරයා විසින් නියම කරනු ලබන කාල සීමාවක් ඇතුළත, ඒ පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය සහ (ඉ) ඡේදය යටතේ තෝරා පත් කරන ලද ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ සභිකයන්ගෙන් පිළිවෙළින් නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කරගත් සේ ප්‍රකාශයට පත් කරනු ලැබිය යුත්තේ කවර සභිකයන් දැයි තීරණය කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය. තේරීම් භාර නිලධරයා විසින් නියම කරන ලද කාලසීමාව ඇතුළත ඒ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් ඔහුගේ තීරණය තේරීම් භාර නිලධරයා වෙත දන්වා සිටියේ නම්,

ඒ තීරණයේ නිශ්චිතව පිළිවෙළින් සඳහන් කරනු ලැබූ සභිකයන් නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා ලෙස තේරී පත් වූ බව තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කල යුතු ය. අනික් අතට තේරීම් භාර නිලධරයා විසින් නිශ්චය කරන ලද කාලසීමාව ඇතුළත සිය තීරණය තේරීම් භාර නිලධරයාට දන්වා සිටීමට ඒ ලේකම්වරයාට හෝ කණ්ඩායම් නායකයාට නොහැකි වූයේ නම්, ඒ පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් තෝරා පත්කර ගන්නා ලද ලෙස ප්‍රකාශයට පත් කරන ලද සභිකයන්ගෙන් වැඩිම සහ ඊළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබාගෙන ඇති සභිකයන් පිළිවෙළින් නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා ලෙස තේරී පත් වූ බව තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් "ඒ පළාත් පාලන ආයතනය සඳහා ඒ ඡන්ද විමසීමේ දී තෝරා පත්කර ගත යුතු, නගරාධිපතිවරයා සහ නියෝජ්‍ය නගරාධිපතිවරයා හැර, අනිකුත් සභිකයන් සංඛ්‍යාවෙන්" යන වචන වෙනුවට "ඒ පළාත් පාලන ආයතනය සඳහා ඒ ඡන්ද විමසීමේ දී තෝරා පත්කර ගත යුතු සභිකයන් සංඛ්‍යාවෙන් දෙකක් අඩු කළ සංඛ්‍යාවෙන්" යන වචන ආදේශ කිරීමෙන්.

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය සහ (ඉ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඇ) ((අ) ඡේදය යටතේ සුදුසුකම් නොලැබූ පක්ෂ හෝ කණ්ඩායම් හැර) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම ලැබූ ඡන්ද සංඛ්‍යාව, එසේ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලැබූ පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් ආරම්භ කොට සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදනු ලැබිය යුතු ය. ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගත් මනාප සංඛ්‍යාව අනුව, ඒ පක්ෂය හෝ කණ්ඩායම ලැබූ ඡන්ද සංඛ්‍යාව සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලැබෙන ලබ්ධ සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවක් (වැඩිම මනාප සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයා පළමුවැන්නා ලෙස තෝරා පත්කර ගත් ලෙස ප්‍රකාශ කිරීම, ඊළඟට වැඩිම මනාප සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයා ඊළඟට තෝරා පත් කරගත් ලෙස ප්‍රකාශ කිරීම යන වශයෙන්) ඒ එක් එක් පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් තෝරා පත්කර ගන්නා ලදැයි තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ බෙදීමෙන් පසු ශේෂ වන යම් ඡන්ද සංඛ්‍යාවක් වේ නම්, ඒ ඡන්ද

සංඛ්‍යාව සම්බන්ධයෙන්, අවශ්‍ය වෙතොත් (ඉ) ඡේදය යටතේ ක්‍රියා කළ යුත්තේ ය. වැඩිම ඡන්ද සංඛ්‍යාව ලැබූ පක්ෂය හෝ කණ්ඩායම, එසේ බෙදීමෙන් පසු සභිකයන් ලෙස තෝරා පත් කර ගනු ලැබීමට එය හිමිකම් ලබන අපේක්ෂකයන් සංඛ්‍යාවට අමතරව, තවත් අපේක්ෂකයන් දෙදෙනකු සභිකයන් ලෙස තෝරා පත්කර ගනු ලැබීමට, හිමිකම් ලබන්නේ ය.

(ඉ) (ඇ) ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි සභිකයන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසුව, තවත් එක සභිකයකු හෝ ඊට වැඩි සභිකයන් සංඛ්‍යාවක් හෝ තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමට ඇති විට, (ඇ) ඡේදය යටතේ සභිකයන් තෝරා පත් කිරීම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, එක් එක් පක්ෂය හෝ කණ්ඩායමේ වැසියට ඇති (ඇ) ඡේදයෙහි සඳහන්, ශේෂ වූ ඡන්ද සංඛ්‍යාව මත (ඇ) ඡේදය යටතේ එක ද අපේක්ෂකයකුවත් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරන ලැබ නොමැති යම් පක්ෂයක් හෝ කණ්ඩායමක් විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව මත, තෝරා පත්කර ගත යුතු මුළු සභික සංඛ්‍යාව තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලබන තෙක්, එවැනි වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ඇති පක්ෂය හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද වැඩිම හෝ ඊළඟට වැඩිම මනාප සංඛ්‍යාවක් ලබාගෙන ඇති අපේක්ෂකයා සභිකයකු ලෙස පත් කරනු ලැබිය යුතු ය.";

(4) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(උ) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන යටතේ එය විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන්ගෙන් එක් තැනක සභිකයකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කරනු ලැබීමට හිමිකම් ලැබුව ද, එය විසින් නාම යෝජනා කරන ලද හෝ එය විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයෙහි ශේෂව ඇති හෝ එක ද අපේක්ෂකයකුවත් කිසිම මනාපයක් ලබාගෙන නොමැති අවස්ථාවක, තේරීම් භාර නිලධරයා නිශ්චය කරනු ලබන කාලසීමාවක් ඇතුළත, ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන්ගෙන් හෝ එය විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයේ ශේෂව ඇති අපේක්ෂකයන්ගෙන් කවර අයකු සභිකයා ලෙස තෝරා පත්කර ගත් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු දැයි තීරණය කරන ලෙස තේරීම් භාර නිලධරයා විසින්

ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ඒ කණ්ඩායමේ කණ්ඩායම් නායකයාගෙන් හෝ ඉල්ලා සිටිය යුතු ය. ඒ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා තෝරීම් භාර නිලධරයා විසින් නිශ්චය කරන ලද කාල සීමාව ඇතුළත සිය තීරණය තෝරීම් භාර නිලධරයාට දන්වා සිටියේ නම්, ඔහු විසින් ඒ තීරණයේ නිශ්චිතව සඳහන් අපේක්ෂකයා සභිකයකු ලෙස තෝරා පත් කරනු ලැබ ප්‍රකාශයට පත් කළ යුතු ය. අනික් අතට, තෝරීම් භාර නිලධරයා විසින් නිශ්චය කරන ලද කාල සීමාව ඇතුළත ඒ ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් ඔහුගේ තීරණය තෝරීම් භාර නිලධරයා වෙත දන්වා නොසිටියේ නම්, ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයේ ඊළඟට නම දැක්වෙන අපේක්ෂකයා සභිකයකු ලෙස තෝරා පත් කරන ලද බව තෝරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.";

(5) ඒ වගන්තියේ අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"(4) පළාත් පාලන ආයතනයකට තෝරා පත් කර ගැනීම සඳහා, පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් එක සමාන මනාප සංඛ්‍යාවක් ලබා ගෙන ඇත්තා වූ හෝ, පිළිගත් දේශපාලන පක්ෂකින් නැතහොත් ස්වාධීන කණ්ඩායමකින් පළාත් පාලන ආයතනයකට තෝරා පත් කරගනු ලැබූ සභිකයන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් ඒ ඡන්ද විමසීමේ දී එක සමාන මනාප සංඛ්‍යාවක් ලබා ගෙන ඇත්තා වූ ද, එක් අමතර මනාපයක් එකතු වුවහොත්, අවස්ථාවෝචිත පරිදි, ඒ අපේක්ෂකයන්ට ඒ පළාත් පාලන ආයතනයේ සභිකයන් වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ, එකී සභිකයන් අතුරින් එක් සභිකයකුට ඒ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා නැතහොත් නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ බව ප්‍රකාශ කරවා ගැනීමට හිමිකම ඇති වින්නා වූ ද අවස්ථාවක දී, මේ වගන්තියේ සහ 65අ වන වගන්තියේ කාර්ය සඳහා, ඒ අමතර මනාපය දෙන ලදැයි සලකනු ලැබිය යුතු අපේක්ෂකයා හෝ සභිකයා කවරුන්දැයි නිශ්චය කිරීම, තෝරීම් භාර නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට තෝරීම් භාර නිලධරයා ඉදිරියේ දී කුසපත් ඇදීමෙන් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 අ වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 65අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1), (2), (3), (4) සහ (5) වන උප වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන් :—

(1) මරණය, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා නගරාධිපතිවරයාගේ හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ ධුරය හිස් වුවහොත්, දිස්ත්‍රික්කයේ තෝරීම් භාර නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක් ඇතුළත, එම පළාත් පාලන ආයතනයේ එම පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අයත් සභිකයන් අතුරින්, අවස්ථාවෝචිත පරිදි, නගරාධිපති හෝ නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබ බවට ප්‍රකාශ කළ යුතු වන්නේ කවර සභිකයා දැයි තීරණය කරන ලෙස. එසේ ධුරය හිස් කළ නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් එම දිස්ත්‍රික්කයේ තෝරීම් භාර නිලධරයා විසින් ඉල්ලා සිටිය යුතු ය. තෝරීම් භාර නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදය තුළ එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා ස්වකීය තීරණය තෝරීම් භාර නිලධරයාට දැනුම් දුනහොත් තෝරීම් භාර නිලධරයා විසින් එම තීරණයේ නිශ්චිතව සඳහන් සභිකයා අවස්ථාවෝචිත පරිදි, නගරාධිපති හෝ නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරී පත් වූ බව ප්‍රකාශයට පත් කළ යුතු ය. අනෙක් අතට, එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් ස්වකීය තීරණය නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත තෝරීම් භාර නිලධරයාට දැනුම් නොදුනහොත් තෝරීම් භාර නිලධරයා විසින්—

(අ) පුරප්පාඩුව සිදු වී ඇත්තේ නගරාධිපති ධුරයේ වූ අවස්ථාවක නම්, එම පළාත් පාලන ආයතනයේ සභිකයන් තෝරා පත් කර ගැනීමේ දී මනාප වැඩිම සංඛ්‍යාවක් ලබා සිටින එම පළාත් පාලන ආයතනයේ එම පක්ෂයට හෝ කණ්ඩායමට අයත් සභිකයා නගරාධිපති වශයෙන් තෝරී පත් වූ බව ප්‍රකාශයට පත් කළ යුතුය ; නැතහොත්

(ආ) පුරප්පාඩුව සිදු වී ඇත්තේ නියෝජ්‍ය නගරාධිපති ධුරයේ වූ අවස්ථාවක නම් එම පළාත් පාලන ආයතනයේ සභිකයන් තෝරා පත් කර ගැනීමේ දී (නගරාධිපති හැර) මනාප වැඩිම ගණනක් ලබාගත් එම පළාත් පාලන ආයතනයේ එම පක්ෂයට හෝ කණ්ඩායමට අයිති සභිකයා නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තේරී පත් වූ බව ප්‍රකාශයට පත් කළ යුතු ය.

(2) මරණය, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සභිකයකුගේ ධුරය හිස් වුවහොත් දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදය ඇතුළත එම පුරප්පාඩුව පිරවීම සඳහා එම පළාත් පාලන ආයතනයේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා මේ ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කරන ලෙස ධුරය ශය කරන සභිකයා අයත් ව සිටි පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය. නියමිත කාල පරිච්ඡේදය ඇතුළත එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කරනු ලැබුවහොත් ද එම පුරප්පාඩුව පිරවීම සඳහා නාම යෝජනා කරන ලද තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි දිවුරුම් දී හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද්දා වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයේ වූ ද අවස්ථාවෝචිත පරිදි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් එම නාම යෝජනාව සමඟ ඇත් නම් ද, තේරීම් භාර නිලධරයා විසින් එම තැනැත්තා එම පළාත් පාලන ආයතනයේ සභිකයකු ලෙස තේරී පත් වූ බව ප්‍රකාශයට පත් කළ යුතු ය. අනෙක් අතට නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත නාම යෝජනා කිරීම එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් නොකරන ලද අවස්ථාවක එම පක්ෂය හෝ කණ්ඩායම විසින් භාර දෙන ලද නාම යෝජනා පත්‍රයෙන් එම පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් එම පළාත් පාලන ආයතනයට තේරී පත් වූ බව ප්‍රකාශයට පත් කරන ලද අවසාන සභිකයා ළඟට එම පළාත් පාලන ආයතනයට සභිකයන් තෝරා පත් කර ගැනීමේ දී මනාප වැඩි ගණන ලබා ගත් අපේක්ෂකයා, සභිකයා වශයෙන් තේරී පත් වූ බව තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

එම නාම යෝජනා පත්‍රයේ නම් ඇතුළත්ව තිබූ සියලුම අපේක්ෂකයන් තේරී පත් වී ඇති හෝ එම නාම යෝජනා පත්‍රයේ නම් ඉතිරිව ඇති අපේක්ෂයන්ගෙන් කිසිවකුට මනාප කිසිවක් ලැබී නැති අවස්ථාවක දී තේරීම් භාර නිලධරයා විසින් නොපමාව කොමසාරිස්වරයා මගින් ඒ බව අමාත්‍යවරයාට දැනුම් දිය යුතු ය. සුදුසු යයි අමාත්‍ය වරයා විසින් අදහස් කරනු ලබන කවර හෝ අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එම පුරප්පාඩුව පිරවීම සඳහා ඡන්ද විමසීමක් පවත්වන ලෙස කොමසාරිස්වරයාට විධාන කළ හැකි ය. එම පුරප් පාඩුව පිරවීම සඳහා තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා අන්තිමට පවත්වන ලද මහා ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගන්නා ලද සභික යන්ගේ ධුර කාලය අවසාන වන තෙක් ධුරය දැරිය යුතුය. ";

(2) එම වගන්තියේ (6), (7), (8) සහ (9) වන උපවගන්ති පිළිවෙළින් එම වගන්තියේ (3), (4), (5) සහ (6) වන උපවගන්ති වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ නැවත අංක කරන ලද (3) වන උපවගන් තියේ "(5) වන උපවගන්තිය" යන යෙදුම වෙනුවට "(2) වන උපවගන්තිය" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ නැවත අංක කරන ලද (4) වන උපවගන් තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) (2) වන උපවගන්තිය යටතේ ඡන්ද විමසීමක් පවත්වන විට යම් පළාත් පාලන ආයතනයක නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති ධුර පුරප් පාඩු වී ඇති අවස්ථාවක, එම ඡන්ද විමසීමෙන් පසුව එම පළාත් පාලන ආයතනයේ සභිකයන් බහුතරයක් සිටින පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් තම සාමාජිකයන් අතුරින් නගරාධි පති සහ නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගත යුතු වන්නේ කවර සභිකයන් ද යන තීරණය කරන ලෙස තේරීම් භාර නිලධරයා විසින් ඉල්ලා සිටිය යුතු අතර, ඊට පසුව එම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.";

(5) එම වගන්තියේ නැවත අංක කරන ලද (5) වන උපවගන්තියේ—

(අ) "(5) වන උපවගන්තිය" යන යෙදුම වෙනුවට "(2) වන උපවගන්තිය" යන යෙදුම ආදේශ කිරීමෙන්; සහ

(ආ) "(7) වන උපවගන්තිය" යන යෙදුම වෙනුවට "(4) වන උපවගන්තිය" යන යෙදුම ආදේශ කිරීමෙන්;

(6) එම වගන්තියේ (6) වන උපවගන්තියේ—

(අ) "(7) සහ (8) වන උපවගන්ති" යන යෙදුම වෙනුවට "(4) සහ (5) වන උපවගන්ති" යන යෙදුම ආදේශ කිරීමෙන්; සහ

(ආ) "(5) වන උපවගන්තිය" යන යෙදුම වෙනුවට "(2) වන උපවගන්තිය" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ "තමා ඡන්දය දුන්නේ කවරකුට ද යන බව" යන වචන වෙනුවට "තමා ඡන්දය දුන්නේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද ඒ දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ ඔහුගේ මනාප දැක්වූයේ යම් අපේක්ෂකයකුට ද ඒ අපේක්ෂකයා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75අ වන වගන්තිය ඇතුළත් කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මින් එහි ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 75අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :—

"කණ්ඩායම් නායකයා.

75අ. ස්වාධීන කණ්ඩායමක කණ්ඩායම් නායකයා ලෙස නාමෝද්දිෂ්ට යම් තැනැත්තකු—

(අ) පළාත් පාලන ආයතනයක් සඳහා ඡන්ද විමසීමක් පැවැත්වෙන අතරතුර මිය ගිය හොත්, ඒ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයේ, අවස්ථාවෝචිත පරිදි, පළමුවැන්නා හෝ දෙවැන්නා වශයෙන් නම් සඳහන්ව ඇති අපේක්ෂකයා ඒ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා ලෙස සලකනු ලැබිය යුතුය;

(ආ) පළාත් පාලන ආයතනයක් සඳහා වූ ඡන්ද විමසීමකින් පසුව මිය ගියහොත් ඒ ස්වාධීන කණ්ඩායමෙන් ඒ පළාත් පාලන ආයතනයට තෝරා පත් කර ගනු ලැබුවා වූ ද ඒ ඡන්ද විමසීමේ දී වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත්තා වූ ද සභිකයා ඒ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා ලෙස සලකනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

(ඉඉ) ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් ඡන්දපොළක් තුළ දී ඕනෑකමින් ම ප්‍රදර්ශනය කරන හෝ ; සහ

(2) එම උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන්—

(ඔ) මේ පනත යටතේ තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක හෝ මේ පනතේ නවවන උපලේඛනයෙහි දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග යටතේ තමා වෙත එවන ලද යම් අනන්‍යතා ප්‍රකාශ පත්‍රයක ඕනෑකමින් ම අසත්‍ය ප්‍රකාශයක් කරන ; හෝ

(ඕ) තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක් හෝ යම් අනන්‍යතා ප්‍රකාශ පත්‍රයක් හෝ නවවන උපලේඛනයේ දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝගවල අර්ථානුකූල වූ යම් ආවරණ ලියුම් කවරයක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් නිසි බලය නොමැතිව විනාශ කරන, ලබා ගන්නා, විවෘත කරන හෝ අන්‍යාකාරයකින් එය වෙනස් කරන නැතහොත් එයට අයුතු යමක් කරන.

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"බලයලත් නියෝජිතයා" යන්න පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ බලයලත් නියෝජිතයා වීමට ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් යම් තැනැත්තකුට ප්‍රකාශිතවම ලියවිල්ලකින් බලය දී ඇත්තේ ද සහ එසේ බලය දෙන ලද බව නාම යෝජනා කිරීමේ කාල සීමාව ආරම්භ වීමට යටත් පිරිසෙයින්

පැය හැත්තෑදෙකකට පෙර ඒ ලේකම් විසින් ඡන්ද විමසීම පැවැත්වෙන ඡන්ද ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා වෙත දැනුම් දී ඇත්තේද, එවැනි තැනැත්තෙක් අදහස් වේ;

(2) "කොමසාරිස්වරයා" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"කොමසාරිස්වරයා" යන්නෙන් මැතිවරණ කොමසාරිස්වරයා අදහස් වේ;'

(3) "මැතිවරණ නිලධරයා" යන්නෙහි අර්ථ කථනය අත්හැරීමෙන්.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ "...... මහ නගර සභාවේ" යන වචනවල සිට "නම් කරනු ලැබේ." යන වචන දක්වා ඇති සියලු වචන අත්හැර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

"...................... මහා නගර සභාවේ/නගර සභාවේ/ප්‍රාදේශීය සභාවේ සභිකයන් තෝරා පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන ඡන්ද විමසීමේ දී තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂකයන් වශයෙන් පහත නම් සඳහන් තැනැත්තන් පිළිගත් දේශපාලන පක්ෂයක් වන .............................. පක්ෂය විසින්/(ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට) (...................... කණ්ඩායම් නායකයා වන) ස්වාධීන අපේක්ෂක කණ්ඩායම විසින්, මෙයින් නාම යෝජනා කරනු ලැබේ.".

30. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ "සටහනක් කළ යුතු ය. (ඒ මෙසේය X)" යන වචන වෙනුවට "සටහනක් කළ යුතුය. (ඒ මෙසේය X) ඊට පසුව ඔහු විසින් එම පිළිගත් දේශපාලන පක්ෂය විසින් හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් අතුරින් තුන් දෙනකුට නොවැඩි අපේක්ෂකයන් ගණනකට ඇති තම මනාප, ඒ එක් එක් අපේක්ෂකයාට වෙන් කර දී ඇති අනුක්‍රමික අංකයට අනුරූප අංකය ඇතුළත් ඡන්ද පත්‍රිකාවේ පහතින් වූ කොටුවේ (මෙසේ 'X' කතිරයක් ගැසීමෙන් ඇක්විය යුතු ය.)" යන වචන ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ **තුන් වන** උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

**තුන්වන උපලේඛනය**

| | |
|---|---|
| **උප පත්‍රිකා අංකය.** | " අ " පක්ෂය * |
| **සැලකිය යුතුයි :** | " ආ " පක්ෂය * |
| ඡන්ද පත්‍රිකාවෙහි පසුපස ඇති අංකයට අනුරූප වූ අංකයක් උප පත්‍රිකාවෙහි තිබිය යුතුය. | " ඇ " පක්ෂය * |
| | " ස්වාධීන කණ්ඩායම " 1 * |
| | " ස්වාධීන කණ්ඩායම " 2 * |
| | " ස්වාධීන කණ්ඩායම " 3 * |

එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ නම සහ " ස්වාධීන කණ්ඩායම " යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් මුද්‍රණය කළ යුතු ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 |
| 13 | 14 | 15 | 16 | 17 | 18 |
| 19 | 20 | 21 | | | |

* එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ ලකුණ.

ප්‍රධාන ප්‍රඥප්තියේ අටවන උපලේඛනය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ අටවන උපලේඛනයේ 1, 2, 3 සහ 4 යන විෂයයන් අත් හැරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ නවවන උපලේඛනය ඇතුළත් කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ අටවන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන උපලේඛනය ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ නවවන උපලේඛනය ලෙස බලපැවැත්විය යුතු ය :—

‘ නවවන උපලේඛනය

(39ආ වන වගන්තිය)

ලුහුඬු නාමය.

**1.** මේ නියෝග 1987 (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්) තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල කාර්ය සඳහා— (අර්ථ නිරූපණය.)

"නිකුත් කිරීම" යන්නට, මුල් නිකුත් කිරීම සහ පසුව කෙරෙන යම් නිකුත් කිරීමක් ඇතුළත් වේ;

"තැපැල් ඡන්ද පත්‍රිකාව" යන්නෙන්, තැපැල් ඡන්දදායකයකුට නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් අදහස් වේ;

"තැපැල් ඡන්දදායකයා" යන්න ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු ඉන් අදහස් වේ;

"උපලේඛනය" යන්නෙන්, මේ නියෝගවල උපලේඛනය අදහස් වේ;

"ආඥාපනත" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත අදහස් වේ.

3. තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක් උපලේඛනයේ "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය. (තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමේ ආකෘතිය.)

4. (1) මේ නියෝගයේ විධිවිධානවලට යටත්ව, ආඥාපනත යටතේ තේරීම් භාර නිලධරයා විසින් තබා ගනු ලබන තැපැල් ඡන්දදායකයන් පිළිබඳ වාර්තාව හා ඔවුන්ගේ ලැයිස්තුව පහසු යයි ඔහුට පෙනී යන ආකෘතියක විය යුතු අතර, තේරීම් භාර නිලධරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොටස් සංඛ්‍යාවකින් තබාගනු ලැබිය හැකි ය. (තැපැල් ඡන්දදායකයන් පිළිබඳ වාර්තාව සහ ඔවුන්ගේ ලැයිස්තුව.)

(2) තැපැල් ඡන්දදායකයකුගේ ඡන්ද පත්‍රිකාවක් යවනු ලැබිය යුතු ලිපිනය තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි ඔහුගේ නමට ඉදිරියෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි හෝ ඒ ලැයිස්තුවේ එක් එක් කොටසක ඇති නම්වලට, අනුගාමිකව අංක යෙදිය යුතු ය.

(4) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව පිළියෙළ කරනු ලැබූ වහාම, තේරීම් භාර නිලධරයා විසින්, එහි පිටපතක් පරීක්ෂණය සඳහා තම කාර්යාලයේ තැබීමෙන්, එය ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය.

5. තැපැල් ඡන්ද පත්‍රිකාවක්, තැපැල් ඡන්දදායකයන් නොවන ඡන්දදායකයන්ට භාර දෙනු ලබන ඡන්ද පත්‍රිකාවල ආකෘතියෙහි ම සහ ඒ ඡන්ද පත්‍රිකාවලින් වෙන්ව හඳුනාගත නොහැකි පරිදි විය යුතු ය.

අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය.

6. තැපැල් ඡන්දදායකයකුට, ඔහුගේ තැපැල් ඡන්ද පත්‍රිකාව සමඟ යවනු ලබන අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය, උපලේඛනයේ "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

ලිපිකරුවන් පත් කිරීම.

7. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී තේරීම් භාර නිලධරයාට ලිපිකරුවන් වශයෙන් සහායවීම සඳහා තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ඡන්ද විමසීමේ දී හෝ ඡන්ද විමසීම සම්බන්ධයෙන් අපේක්ෂකයකු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ සේවයෙහි නියුක්ත කරනු ලැබූ කිසිම තැනැත්තකු එසේ පත් කරනු නො ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේදී සහ භාරගැනීමේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තෝ.

8. (1) (අ) තේරීම් භාර නිලධරයා සහ ඔහුගේ ලිපිකරුවන්;

(ආ) බලයලත් නියෝජිතයකු හෝ කණ්ඩායම් නායකයකු;

(ඇ) බලයලත් නියෝජිතයකු හෝ කණ්ඩායම් නායකයකු විසින් තමා වෙනුවට පැමිණ සිටීම පිණිස පත් කරනු ලැබූ තැනැත්තකු; සහ

(ඈ) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් නියෝජිතයකු

නොවන කිසිම තැනැත්තකුට තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී පැමිණ සිටිය නොහැකි ය.

(2) තැපැල් ඡන්ද පත්‍රිකා කාණ්ඩ දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකවර නිකුත් කළ යුතු අවස්ථාවක එක් එක් බලය ලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් එක් නියෝජිතයකු බැගින් හෝ ඒ බලය ලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් පත් කරනු ලැබීමට තේරීම් භාර නිලධරයා විසින් බලය දෙනු ලැබිය හැකි සංඛ්‍යාවක් දක්වා වූ ද ඒ කාණ්ඩ සංඛ්‍යාව නොඉක්මවන්නා වූ ද නියෝජිතයන් වැඩි ගණනක් හෝ පත් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, එක් එක් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා සම්බන්ධයෙන් බලය දෙනු ලැබූ නියෝජිතයන් ගණන සමාන විය යුතුය.

(3) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින දැක්වෙන පත් කිරීමේ දැන්වීම් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සඳහා නියමිත වේලාවට කලින් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් තේරීම් භාර නිලධරයාට දෙනු ලැබිය යුතු ය.

(4) නියෝජිතයකු මිය ගියහොත් හෝ ඔහුට ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් ඔහු වෙනුවට වෙනත් නියෝජිතයකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරන ලද නියෝජිතයාගේ නම සහ ලිපිනය පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් තේරීම් භාර නිලධරයාට වහාම දෙනු ලැබිය යුතු ය.

(5) නියෝජිතයන් පත් කිරීම හා ඔවුන් පත් කිරීම පිළිබඳ දැන්වීම් තේරීම් භාර නිලධරයාට දීම බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින්ම කරනු ලැබීම වෙනුවට පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් හෝ යථා පරිදි බලය දී ඇත්නම්, නාම යෝජනා පත්‍රයේ නම සඳහන් අපේක්ෂකයා විසින් කරනු ලැබිය හැකි ය.

(6) මේ නියෝගවල, නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම්, ස්වකීය පත්වීම් යථා පරිදි කරනු ලැබූ හා දැනුම් දෙනු ලැබූ නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වශයෙන් ද, මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරන ලද නියෝජිතයන් සම්බන්ධයෙන් වන විට, තේරීම් භාර නිලධරයා විසින් බලය දෙන ලද සංඛ්‍යාව ඇතුළත වූ නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වශයෙන් ද තේරුම් ගනු ලැබිය යුතු ය.

(7) බලයලත් නියෝජිතයකු හෝ කණ්ඩායම් නායකයකු හෝ විසින් තමාගේ යම් නියෝජිතයකු පත් කරනු ලැබුවහොත්, ඒ නියෝජිතයාට කිරීමට බලය දෙනු ලැබිය හැකි වූ යම් ක්‍රියාවක් හෝ දෙයක් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් ම කිරීම හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමෙහි ලා තමාගේ නියෝජිතයාට සහායවීම හෝ කරනු ලැබිය හැකි ය.

(8) බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ ඉදිරියෙහි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට මේ නියෝග වලින් නියමිතව හෝ බලය දී ඇති අවස්ථාවක, එවැනි යම් තැනැත්තකු හෝ තැනැත්තන් ඒ කාර්යය සඳහා නියමිත වේලාවට, එසේ නියමිත ස්ථානයට පැමිණ නොසිටිය ද ඒ ක්‍රියාව හෝ දෙය අන් සෑම අතින්ම වලංගු පරිදි කර ඇත්නම් ඒ පැමිණ නොසිටීමෙන් ඒ ක්‍රියාව හෝ දෙය අවලංගු නොවිය යුතු ය.

4—ඒ 096134 (87/03)

රහස්‍යතා ප්‍රකාශය.

**9.** (1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතු සඳහා පැමිණ සිටින සෑම තැනැත්තකු විසින් ම, ඒ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර මෙහි උපලේඛනයේ "ඇ" ආකෘතියට සානුකූලව රහස්‍යතා ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ වූ ප්‍රකාශයක් තේරීම් භාර නිලධරයා විසින් සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට කරනු ලැබිය යුතු අතර වෙනත් යම් තැනැත්තකු විසින් එය කරනු ලබන විට, එය තේරීම් භාර නිලධරයා හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ ඉදිරිපිට කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ කටයුතු සඳහා පැමිණ සිටින සෑම තැනැත්තකු විසින් ම, ඡන්දය දීමේ රහස්‍යතාව රැක ගැනීම සහ රැක ගැනීමට ආධාරවීම කළ යුතු අතර—

(අ) නීතියෙන් බලය දෙනු ලැබූ යම් කාර්යයක් සඳහා හැර, තැපැල් ඡන්ද පත්‍රිකා මත කරන ලද නිල ලකුණ පිළිබඳ ඒ කටයුතුවල දී ලබාගත් යම් තොරතුරක් ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමට පෙර, යම් තැනැත්තකුට දැනුම් දීම, හෝ

(ආ) නීතියෙන් බලය දෙනු ලැබූ යම් කාර්යයක් සඳහා හැර, තැපැල් ඡන්ද පත්‍රිකාවක පිටපැත්තේ සඳහන් අංකය පිළිබඳව ඒ කටයුතුවල දී ලබාගත් තොරතුරක් කවර හෝ විටක යම් තැනැත්තකුට දැනුම් දීම

නොකළ යුතු ය.

(4) මේ නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධාන කඩකරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ දැන්වීම.

**10.** (1) තේරීම් භාර නිලධරයා විසින්, ඡන්ද විමසීමක නාම යෝජනා කාලසීමාවේ අවසන් දිනයට පසු දින දහයක් ඉකුත් වීමට පෙර, තමා විසින් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ එකී නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් හෝ පත් කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව, ඒ එක් එක් බලයලත් නියෝජිතයාට සහ කණ්ඩායම් නායකයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) තේරීම් භාර නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකා කිසිවක් පසුව නිකුත් කරනු ලබන අවස්ථාවක, තමා විසින් එසේ පසුව නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් පත කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව, ඒ එක් එක් බලයලත් නියෝජිතයාට සහ කණ්ඩායම් නායකයාට, හැකිතාක් ඉක්මණින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා මත තැබිය යුතු නිල ලකුණ.

11. (1) එක් එක් තැපැල් ඡන්දදායකයා වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාව පිටිපස නිල ලකුණින් මුද්‍රා තැබීම හෝ නිල ලකුණ සිදුරු කිරීම හෝ කරනු ලැබිය යුතු ය. තව ද ඒ ඒ ඡන්දදායකයාගේ නම සහ අංකය හඬ නගා කියවා, ඒ ඒ ඡන්ද දායකයාගේ අංකය ඒ එක් එක් ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවෙහි ලකුණු කරනු ලැබිය යුතු ය. තව ද, ඒ ඡන්ද පත්‍රිකාව ඔහුට නිකුත් කරන ලද බව දැක්වීම පිණිස එහෙත් ඔහුට නිකුත් කරන ලද නිශ්චිත ඡන්ද පත්‍රිකාව කුමක්දැයි නොදක්වා තැපැල් ඡන්ද දායකයාගේ ලැයිස්තුවෙහි ඒ ඡන්දදායකයාගේ අංකය ඉදිරියෙන් ලකුණක් තැබිය යුතු ය.

(2) තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවෙහි ලකුණු කරනු ලැබිය යුතු ඒ ඡන්ද දායකයාගේ අංකය, තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි සඳහන් ඒ ඡන්දදායකයාගේ අංකය විය යුතු ය.

(3) තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවෙහි මුද්‍රණය කර ඇති අංකය ඒ ඡන්දදායකයා වෙත යවනු ලබන අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතියෙහි ලකුණු කරනු ලැබිය යුතුය. එසේ ලකුණු කරනු ලැබූ අංකය මෙහි මින් මතු "අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කරන ලද අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

තැපැල් ඡන්ද පත්‍රිකාව නිකුත් කිරීමට ප්‍රතික්ෂේප කිරීම.

12. තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි ඇතුළත් සටහන් දෙකක් එකම තැපැල් ඡන්දදායකයා සම්බන්ධයෙන් වන බවට තේරීම් භාර නිලධරයකු සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් ඒ ඡන්දදායකයා වෙනුවෙන් එක තැපැල් ඡන්ද පත්‍රිකාව කට වැඩි ගණනක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

"ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය" යන යෙදුම සහ "ආවරණ ලියුම් කවරය" යන යෙදුම අර්ථ නිරූපණය කිරීම.

13. (1) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය මේ නියෝගවල "ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) යථා පරිදි ලකුණු කොට ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි බහා ලූ තැපැල් ඡන්ද පත්‍රිකාව සහ යථා පරිදි පුරවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය ආපසු එවීම පිණිස වූ ලියුම් කවරය මේ නියෝග වල "ආවරණ ලියුම් කවරය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

තැපැල් ඡන්ද දායකයන් අමතා යවනු ලබන ලියුම් කවර තැපැල් කාර්යාලයට භාර දීම.

14. තැපැල් ඡන්දදායකයන් අමතා යවනු ලබන සියලුම ලියුම් කවර, තේරීම් භාර නිලධරයා විසින් ගණන් කොට ළඟම පිහිටි තැපැල් කාර්යාලය වෙත වහාම භාර දෙනු ලැබිය යුතු අතර, එසේ භාර දෙන ලද ලියුම් කවර සංඛ්‍යාව සඳහන් කරමින් තේරීම් භාර නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සි ආකෘතියක් තැපැල් ස්ථානාධිපතිවරයා විසින් තැපැල් කාර්යාලයේ දින මුද්‍රාවෙන් මුද්‍රා තබා, ඒ ලියුම් කවරවල ලිපිනය ඇති තැනැත්තන් වෙත ඒවා භාරදීම සඳහා වහාම යවනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුව සහ උපපත්‍රිකා මුද්‍රා තැබීම.

15. (1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම අවසන් කරනු ලැබීමෙන් පසු තේරීම් භාර නිලධරයා විසින්, හැකි ඉක්මනින් සහ බලයලත් නියෝජිතයන්ගේ හා කණ්ඩායම් නායකයන්ගේ නියෝජිතයන් ඉදිරිපිට දී—

(අ) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ ලකුණු කළ පිටපත් ; සහ

(ආ) නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවල උප පත්‍රිකා වෙන වෙනම පැකැට්ටුවලට දමා ඒ පැකැට්ටු මුද්‍රා තබනු ලැබිය යුතු ය.

(2) තැපැල් ඡන්ද පත්‍රිකා පසුව නිකුත් කිරීමේ කාර්යය සඳහා තේරීම් භාර නිලධරයා විසින් තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ ලකුණු කරන ලද පිටපත් ඇතුළත් මුද්‍රා තබන ලද පැකැට්ටුව විවෘත කරනු ලැබිය හැකි අතර, නිකුත් කිරීම අවසන් වූ පසු මේ නියෝගයේ (1) වන ඡේදය අනුව ඒ පිටපත් නැවතත් පැකැට්ටුවලටම දමා මුද්‍රා තබනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි සැපයීම.

16. (1) තැපැල් ඡන්දදායකයන් වෙත තැපැල් ඡන්ද පත්‍රිකා මුලින් නිකුත් කිරීමේ කටයුතුවල දී, තැපැල් ඡන්දදායකයන්ගෙන් ලැබෙන ආවරණ ලියුම් කවර දැමීම සඳහා ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පෙට්ටි තේරීම් භාර නිලධරයා විසින් සපයනු ලැබිය යුතුය. එවැනි සෑම ඡන්ද පෙට්ටියක්ම ආඥාපනතේ 61අ වන වගන්තියේ කාර්ය සඳහා ඡන්ද පෙට්ටියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදයෙහි සඳහන් සෑම ඡන්ද පෙට්ටියක් ම, පැමිණ සිටින බලයලත් නියෝජිතයන්ගේ සහ කණ්ඩායම් නායකයන්ගේ නියෝජිතයන්ට විවෘතව හා හිස්ව පෙන්වා තේරීම් භාර නිලධරයාගේ මුද්‍රාවෙන් සහ ස්වකීය මුද්‍රා තැබීමට කැමති යම් නියෝජිතයන්ගේ මුද්‍රාවලින් මුද්‍රා තබා "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය" යන්න සහ ඡන්ද විමසීම පවත්වනු ලබන්නේ යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද, ඒ ඡන්ද විමසීම් ප්‍රදේශයේ නම එහි ලකුණු කරනු ලැබිය යුතු අතර තේරීම් භාර නිලධරයා විසින් ඒ ඡන්ද පෙට්ටියේ සුරක්ෂිත භාරය සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

**තැපැල් ඡන්ද දායකයන්ගෙන් ආවරණ ලියුම් කවර ලැබීම.**

17. ඡන්ද විමසීම අවසන් වීමට පෙර ආවරණ ලියුම් කවරයක් ලැබුණු විට, තෝරීම් භාර නිලධරයා විසින්, වහාම තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටිය තුළ එය විවෘත නොකොට බහා ලිය යුතු ය.

**ගණන් කිරීමේ නිලධරයෝ.**

18. කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, තෝරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීම භාරව කටයුතු කිරීම සඳහා ගණන් කිරීමේ නිලධරයකු ද ඒ ගණන් කිරීමේ නිලධරයාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා ඔහුට සහායවීම පිණිස සහායකයන්, ලිපිකරුවන් සහ වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් ද පත් කළ යුතු අතර ඔහු එසින් ඒ පත්වීම් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

**ගණන් කිරීම පිළිබඳ දැන්වීම.**

19. ඡන්ද විමසීම අවසන් කළ පසු හැකි ඉක්මණින් තැපැල් ඡන්ද පත්‍රිකා මත වූ ඡන්ද ගණන් කිරීම සඳහා තෝරීම් භාර නිලධරයා විසින් කටයුතු පිළියෙල කළ යුතු අතර තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටීම හා ඒ ගණන් කිරීම ආරම්භ කරන දිනය සහ වේලාව පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් ඡන්ද විමසීමෙහි දී තරඟ කරන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ බලයලත් නියෝජිතයාට සහ යම් ස්වාධීන කණ්ඩායමක කණ්ඩායම් නායකයාට තෝරීම් භාර නිලධරයා විසින් දෙනු ලැබිය යුතු ය.

**ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීම.**

20. යම් පළාත් පාලන ආයතනයක් සඳහා වන ඡන්ද විමසීමක දී අපේක්ෂකයන් නාම යෝජනා කර ඇති එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින්, තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේදී පැමිණ සිටීම සඳහා, ඒ ගණන් කිරීම ආරම්භවීමට පෙර (මෙහි මින් මතු “ගණන් කිරීමේ නියෝජිතයන්” යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජිතයන් දෙදෙනකුට නොවැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින ප්‍රකාශ කරන, ඒ පත් කිරීම් පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක්, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා හෝ එහි බලයලත් නියෝජිතයා විසින් නැතහොත් කණ්ඩායම් නායකයා විසින්, ගණන් කිරීම ආරම්භ වීමට පෙර ගණන් කිරීමේ නිලධරයාට දෙනු ලැබිය යුතු ය. යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ නම සහ ලිපිනය එසේ දැනුම් දී නොමැත්තේ ද ඒ ගණන් කිරීමේ නියෝජිතයා ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළු කර ගැනීම ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

**ගණන් කිරීමේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තෝ.**

21. ගණන් කිරීමේ නිලධරයා ඔහුට සහායවීම පිණිස පත් කරන ලද තැනැත්තන් සහ ගණන් කිරීමේ නියෝජිතයන් හැර වෙනත් කිසිම තැනැත්තකු ගණන් කිරීමේ නිලධරයාගේ අනුමතය ඇතිව මිස, ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේ දී පැමිණ නොසිටිය යුතු ය.

*ගණන් කිරීමේ දී රහස්‍යභාවය රැක ගැනීම.*

**22.** ආඥාපනතේ 76 වන වගන්තියේ විධිවිධාන තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ කටයුතුවලට අදාළ විය යුතු ය.

*තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි විවෘත කිරීම.*

**23.** තැපැල් ඡන්දදායකයන්ගේ සෑම ඡන්ද පෙට්ටියක් ම, ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමෙන් පසුව සහ ඒ නිලධරයා ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී විවෘත කරනු ලැබිය යුතු ය.

*ආවරණ ලියුම් කවර විවෘත කිරීම.*

**24.** (1) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටියක් විවෘත කරනු ලැබූ අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්, ආවරණ ලියුම් කවර සංඛ්‍යාව ගණන් කොට සටහන් කර, ඉන්පසුව එක් එක් ආවරණ ලියුම් කවරය වෙන වෙන ම විවෘත කරනු ලැබිය යුතු ය.

(2) ගණන් කිරීමේ නිලධරයා විසින් ආවරණ ලියුම් කවරයක් විවෘත කරනු ලැබ, එය තුළ—

(අ) (i) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් ; හෝ

(ii) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(iii) අනන්‍යතා ප්‍රකාශයක් පමණක් ; හෝ

(iv) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක් පමණක් ; හෝ

(v) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් පමණක්

ඇති බව සොයාගනු ලබන අවස්ථාවක නැතහොත්

(ආ) කිසිවක් නොමැති බව සොයා ගනු ලබන අවස්ථාවක මේ නියෝගයේ අනුයාත විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන විට, අනන්‍යතා ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලබා ඇති බවටත්, පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය ඡන්ද පත්‍රිකා ලියුම් කවරයේ ලකුණු කර ඇති ඒ හා සමාන අංකයට ද, පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය, ඡන්ද පත්‍රිකා ලියුම් කවරයේ ලකුණු කර ඇති ඒ අංකයට ද අනුරූප වන බවටත්, ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් විය යුතු ය. ඔහු එසේ සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් ඒ ප්‍රකාශය, (මෙහි මින් මතු "අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනම බඳුනකට ද, පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඡන්ද පත්‍රිකාව (මෙහි මින් මතු "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් බඳුනකට ද දැමිය යුතු ය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන අවස්ථාවක, මේ නියෝගයේ (3) වන ඡේදය මඟින් නියමිත පරිදි ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් නොවන විටක ඔහු විසින්—

(අ) "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන අනන්‍යතා ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබිය යුතු ය;

(ආ) ඒ ප්‍රකාශය, පැමිණ සිටින යම් ගණන් කිරීමේ නියෝජිත යන්ට පෙන්වනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය සම්බන්ධ යෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයට යම් නියෝජිතයකු විසින් යම් විරෝධය පෑමක් කරන ලද්දේ නම්, ඉහතින් වූ (අ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයෙහි සටහන් කරන ලද වචනවලට "ප්‍රතික්ෂේප කිරීමට විරෝධය පාන ලදී" යන වචන එකතු කරනු ලැබිය යුතු ය;

(ඇ) පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම් බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය, නැත හොත් පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකාව, ඒ ප්‍රකාශයට ඇමිණිය යුතු ය; තව ද

(ඈ) ප්‍රකාශය සහ ඉහතින් වූ (ඇ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශ යට අමුණා ඇති ලේඛන (මෙහි මින් මතු "තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) බඳුනකට දැමිය යුතු ය.

(5) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (iii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිල ධරයා විසින්, "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම ඡන්ද පත්‍රිකාවක් සහ කිසිම ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් ලැබී නැත" යන වචන අනන්‍යතා ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(6) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (iv) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ගණන් කිරීමේ නිල ධරයා විසින් "ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම අනන්‍යතා ප්‍රකාශයක් ලැබී නැත" යන වචන ඡන්ද පත්‍රිකාවෙහි සටහන් කරනු ලැබිය යුතු අතර, ඒ ඡන්ද පත්‍රිකාව, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(7) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (v) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට අනන්‍යතා ප්‍රකාශයක් ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි බහා ඇත් දැයි නිසැකවම දැන ගැනීම පිණිස ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ලියුම් කවරය විවෘත කරනු ලැබිය යුතු ය.

(8) මේ නියෝගයේ (7) වන ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය විවෘත කරනු ලැබූ කල්හි, අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකාවක් ඒ ලියුම් කවරය තුළ ඇත්නම්, ඒ ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබ ඇති බවටත්, අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය, ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයකට අනුරූප වන බවටත් ගණන් කිරීමේ නිලධරයා විසින් තමා ම සෑහීමට පත් විය යුතු අතර —

(අ) එසේ සෑහීමට පත් වන්නේ නම්, ඒ ප්‍රකාශය, අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුනට දැමිය යුතු අතර ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනට දැමිය යුතු ය; තව ද

(ආ) එසේ සෑහීමට පත් නොවන්නේ නම් —

(i) ඒ ප්‍රකාශයෙහි "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන සටහන් කරනු ලැබිය යුතු ය;

(ii) ඒ ප්‍රකාශය පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්වනු ලැබිය යුතු අතර ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයට යම් නියෝජිතයකු විසින් යම් විරෝධය පෑමක් කරන ලද්දේ නම්, ඉහතින් වූ (i) වන අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයෙහි සටහන් කරන ලද වචනවලට, "ප්‍රතික්ෂේප කිරීමට විරෝධය පාන ලදී" යන වචන එකතු කරනු ලැබිය යුතු ය;

(iii) ඒ ප්‍රකාශයට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ ඒ ඡන්ද පත්‍රිකාව අමුණනු ලැබිය යුතු ය;

(iv) ඒ ප්‍රකාශය සහ ඉහතින් වූ (iii) වන අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණා ඇති ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දමනු ලැබිය යුතු ය.

(9) මේ නියෝගයේ (7) වන ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය විවෘත කරනු ලැබූ විට, එය තුළ —

(අ) අනන්‍යතා ප්‍රකාශයක් පමණක්; හෝ

(ආ) ඡන්ද පත්‍රිකාවක් පමණක්; හෝ

(ඇ) කිසිවක් නොමැති බව,

ගණන් කිරීමේ නිලධරයා විසින් සොයා ගනු ලැබුවහොත්, ඔහු විසින් —

(i) ඉහතින් වූ (අ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඒ ප්‍රකාශයෙහි "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම ඡන්ද පත්‍රිකාවක් ලැබී නැත" යන වචන සටහන් කිරීම;

(ii) ඉහතින් වූ (ආ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඒ ඡන්ද පත්‍රිකාවෙහි "ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම අනන්‍යතා ප්‍රකාශයක් ලැබී නැත" යන වචන සටහන් කිරීම ;

(iii) ඉහතින් වූ (ඇ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී. බහාලූ කිසිවක් ලැබී නැත" යන වචන සටහන් කිරීම ; සහ

(iv) අනන්‍යතා ප්‍රකාශයක් හෝ ඡන්ද පත්‍රිකාවක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය තුළ තිබුණේ නම්, ඒ ප්‍රකාශය හෝ ඡන්ද පත්‍රිකාව ඒ ලියුම් කවරයට ඇමිණීම

කරනු ලැබිය යුතු අතර ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ ඉහතින් වූ (iv) වන අනුඡේදය යටතේ ඒ ලියුම් කවරයට අමුණා ඇති යම් ලේඛනයක් හෝ ලේඛන වේනොත් ඒ ලේඛනය හෝ ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(10) (2) වන ඡේදයේ (ආ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින්, ආවරණ ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී. බහාලූ කිසිවක් ලැබී නැත" යන වචන සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ලියුම් කවරය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(11) අනන්‍යතා ප්‍රකාශයක්, ඒ අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතියේ පිටිපස සඳහන් උපදෙස් ප්‍රකාර අත්සන් කොට සාක්ෂි දරනු ලැබ ඇති නම් මිස, යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

25. (1) 24 වන නියෝගය යටතේ වූ කටයුතු අවසානයේ දී, තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති එක් එක් ඡන්ද පත්‍රිකා ලියුම් කවරය ගණන් කිරීමේ නිලධරයා විසින් වෙන වෙනම විවෘත කරනු ලැබිය යුතු ය. ඡන්ද පත්‍රිකා ලියුම් කවර විවෘත කිරීම.

(2) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක කිසිම ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් නොවන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ලියුම් කවරයෙහි "කිසිම ඡන්ද පත්‍රිකාවක් බහා නොමැත" යන වචන සටහන් කොට එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(3) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් වන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින් —

(අ) ඒ ලියුම් කවරයෙහි ලකුණු කර ඇති අංකය, ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයකට අනුරූප වන්නේ නම්, ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනට දැමීම ; සහ

(ආ) ඒ ලියුම් කවරයෙහි ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් වන අතර ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති අංකය, ඒ ලියුම් කවරයෙහි ලකුණු කර ඇති අංකයට අනුරූප නොවන්නේ නම්, ඒ ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන සටහන් කොට, ඒ ඡන්ද පත්‍රිකාව ඒ ලියුම් කවරයට අමුණා, එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමීම

කරනු ලැබිය යුතු ය.

ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සහ අනන්‍යතා ප්‍රකාශ මුද්‍රා තැබීම.

26. 25 වන නියෝගය යටතේ වූ කටයුතු අවසානයේ දී, ගණන් කිරීමේ නිලධරයා විසින් තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි ඇතුළත් දේ සහ අනන්‍යතා ප්‍රකාශය සඳහා වූ බඳුනෙහි ඇතුළත් දේ වෙන වෙන ම පැකැට්ටු දෙකක බහා ඒ පැකැට්ටු මුද්‍රා තැබිය යුතු ය.

ගණන් කිරීම.

27. (1) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට කලින්, ඔහු විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින්, එහි පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති ඡන්ද පත්‍රිකා පිටතට ගෙන ඒ බඳුනෙහි තිබුණු ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ගණන් කොට වාර්තා කර ගනු ලැබිය යුතු ය.

(2) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති ඡන්ද පත්‍රිකාවල ඡන්ද ගණන් කිරීමෙහි ලා, ආඥාපනතේ 62 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සහ 63 වන සහ 63අ වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

ගණන් කිරීම අවසන් කිරීම.

28. ගණන් කිරීම අවසන් කරනු ලැබූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින්—

(අ) ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා;

(ආ) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා;

(ඇ) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට හෝ දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශය සහ ඒ එක් එක් පක්ෂය හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා ලබා ගෙන ඇති මනාප පිළිබඳව ආඥාපනතේ 63 වන වගන්තියේ (6) වන උපවගන්තියට අනුකූලව පිළියෙළ කරන ලද ප්‍රකාශයක්;

(ඈ) ආඥාපනතේ 63 වන වගන්තියේ (5) වන උපවගන්තියට අනුකූලව සකස් කරන ලද ප්‍රකාශය;

(ඉ) 26 වන නියෝගයේ සඳහන්, මුද්‍රා තබන ලද පැකැට්ටු දෙක; සහ

(ඊ) 27 (1) වන නියෝගය යටතේ, ගණන් කිරීම පිළිබඳ වාර්තාව,

මුද්‍රා තබන ලද පැකැට්ටුවල බහා තේරීම් භාර නිලධරයා වෙත නොපමාව භාර දිය යුතු ය.

## මේ නියෝගවල උපලේඛනය

**'අ' ආකෘතිය**

(3 වන නියෝගය)

### තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉල්ලීම

............................................පළාත් පාලන ප්‍රදේශයේ තේරීම් භාර නිල
(පළාත් පාලන ආයතනයේ නම සඳහන් කරන්න)
ධරයා වෙත ය.

............................................ වන මම ඉහත සඳහන් පළාත් පාලන ප්‍රදේශය සඳහා බලපවත්නා ඡන්ද හිමි නාමලේඛනයේ, මාගේ නම............... ...................................... යනුවෙන් දැක්වෙන බව මෙයින් ප්‍රකාශ කරමි. නාම ලේඛනයෙහි මාගේ නම දැක්වෙන්නේ පහත සඳහන් අනුක්‍රමික අංකය, ඡන්ද ප්‍රදේශය, ඡන්ද කොට්ඨාසය සහ මැතිවරණ කොට්ඨාසය යටතේ වේ:—

මැතිවරණ කොට්ඨාසයේ අංකය :

ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය :

ඡන්ද කොට්ඨාසයේ අංකය :

මගේ නමට අයත් අනුක්‍රමික අංකය :

• (1) (අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ/ශ්‍රී ලංකා නාවික හමුදාවේ/ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන් ;

• (ආ) පොලිස් දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ/තැපැල් දෙපාර්තමේන්තුවේ/විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ/.................................ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;

• (ඇ) ඡන්ද විමසීම හා සම්බන්ධිත කාර්ය සඳහා පත්කරනු ලැබූ/පත් කරනු ලැබීමට ඉඩ ඇති රජයේ සේවයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;

• (ඇ) ඡන්ද විමසීම හා සම්බන්ධිත කාර්ය සඳහා පත් කරනු ලැබූ/පත් කරනු ලැබීමට ඉඩ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන්

මගේ සේවා නියුක්තියේ විශේෂ අවශ්‍යතා කරුණු හේතුවෙන් :

• (2) ........................................ පළාත් පාලන ආයතනය සඳහා මං අපේක්ෂකයකුවීම හේතුවෙන්
(පළාත් පාලන ආයතනයේ නම යොදන්න)

මට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී ඡන්දය දීමට මට නොහැකි/නොහැකි වීමට ඉඩ ඇති බැවින්, ඉහත සඳහන් පළාත් පාලන ආයතනය සඳහා මන්ත්‍රී යන් තෝරා පත් කර ගැනීමේ දී තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට මම මෙයින් ඉල්ලුම් කරමි.

මගේ ඡන්ද පත්‍රිකාව සහ අනිකුත් ලේඛන එවනු ලැබිය යුතු ලිපිනය පහත දැක්වේ :—

| | |
|---|---|
| පහත දැක්වෙන සටහන ප්‍රකාර සහ | ............................................ |
| තික කිරීමේ නිලධරයකු වශයෙන් කට | ............................................ |
| යුතු කිරීමට ඉල්ලුම්කරුට හිමිකමක් | ............................................ |
| නොමැති නම් ඉල්ලුම්කරුගේ සහතික | ............................................ |
| කරන නිලධරයාගේ නිල නාමය සහ | ............................................ |
| ලිපිනය සඳහන් කරන්න. | ............................................ |

සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට ඉල්ලුම්කරුට හිමිකම් ඇත්නම්, ඉල්ලුම්කරුගේ නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න : ..............................................................
..............................................................
..............................................................
..............................................................

..........................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ..............................

*මා/ඉල්ලුම්කරු විසින් මේ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කරන ලද කරුණු හේතු කොට ගෙන *මට/ඔහුට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී *මට/ඔහුට පෞද්ගලිකව ඡන්දය දීමට * නොහැකි/නොහැකිවීමට ඉඩ ඇති බව මම මෙයින් සහතික කරමි.

මේ ඉල්ලුම්පත්‍රයේ දැක්වෙන මගේ නිල නාමය සහ ලිපිනය නිවැරදි ය.
දිනය සහ නිල මුද්‍රාව ...... ...... ........ ...........

.......................... ...
* සහතික කරන නිලධරයාගේ/ඉල්ලුම්කරුගේ
අත්සන සහ නිල නාමය.

* අදාළ නොවන වචන කපා හරින්න.

සටහන

1. සෑම ඉල්ලුම් පත්‍රයක් ම, ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ නාම යෝජනා දැන්වීම පළ කරනු ලැබූ දිනයෙ සිට දින දහයක් ඇතුළත ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියා පදිංචි වී සිටින ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2. සෑම ඉල්ලුම් පත්‍රයක් ම නිසි පරිදි පුරවා තිබිය යුතු ය. එසේ නොවුවහොත් තේරීම් භාර නිලධරයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට යටත් වන්නේ ය.

3. සෑම ඉල්ලුම්කරුවකුට ම තේරීම් භාර නිලධරයාගේ තීරණය දන්වනු ලැබේ.

4. ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ලැබූ යම් ඉල්ලුම්කරුවකු සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට හිමිකම් ලබා ඇත්නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ඔහුගේ නමට සහ ලිපිනයට හෝ, ඔහු එසේ හිමිකම් ලබා නොමැති නම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි නිල නාමය සහ ලිපිනය දක්වා ඇති සහතික කිරීමේ නිලධරයාගේ භාරය යටතේ හෝ ඡන්ද පත්‍රිකාව සහ අනෙකුත් ලේඛන යවනු ලැබේ.

5. "සහතික කිරීමේ නිලධරයා" යන යෙදුම—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෝ සාමාජිකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට,—

(i) ඒ ඉල්ලුම්කරු ඒ යුද්ධ හමුදාවේ හමුදාධිපති හෝ ඒ නාවික හමුදාවේ හමුදාධිපති හෝ ඒ ගුවන් හමුදාවේ හමුදාධිපති නම්, නැතහොත්, ඒ ඉල්ලුම්කරු, තමා සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (1) වන කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා ඉන් අදහස් වේ;

(ආ) රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට—

(i) ඒ ඉල්ලුම්කරු, යම් කාර්යාලයක් භාරව සිටින නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු අදහස් වේ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (1) වන කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාරව සිටින නිලධරයා ඉන් අදහස් වේ;

(ඇ) පළාත් පාලන ඡන්ද විමසීමක අපේක්ෂකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ ඡන්ද විමසීම් ප්‍රදේශය සඳහා වූ තෝරීම් භාර නිලධරයා ඉන් අදහස් වේ.

**"ආ" ආකෘතිය**

**අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය**

**ආකෘතියේ ඉදිරිපස** (6 වන නියෝගය)

**ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය : ..........................**

**(තෝරීම් භාර නිලධරයා විසින් ඇතුළත් කිරීම සඳහා)**

* (මට අත් භාර දෙන ලද) ඉහත දැක්වෙන අනුක්‍රමික අංකය දරන ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇතුළත් ලියුම් කවරය, මගේ අත්සනට සාක්ෂිකරුවකු වන පහත සඳහන් නිලධරයාගේ භාරයේ එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

**(මා දැන් ඉදිරිපත් කරන) ඉහත දැක්වෙන පරිදි අනුක්‍රමික අංකය සහ ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇතුළත් ලියුම් කවරය කෙළින්ම එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

..................................................

ඡන්දදායකයාගේ අත්සන.

දිනය :....................................

ඉහත නම සඳහන් තැනැත්තාට, ඔහුගේ සහතික කිරීමේ නිලධරයා වශයෙන් මා භාරයේ මෙහි සඳහන් කරන ලද ඡන්ද පත්‍රිකාව සහ ලියුම් කවරය එවන ලදී. පැවැත්වීමට ඇති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ අපේක්ෂකයකු වන * මා භාරයේ තිබෙන ඒකකයේ/* ආයතනයේ/* කාර්යාලයේ සේවයෙහි නියුක්තව සිටින, ඉහත නම සඳහන් තැනැත්තා මම පෞද්ගලිකව හඳුනමි.

ඡන්දදායකයා වෙත භාර දෙන ලද ඡන්ද පත්‍රිකාව ඔහු විසින්, මගේ කාර්යාලයෙහි සපයා ඇති ආවෘත ස්ථානය තුළ දී එකෙණෙහි ම ලකුණු කරන ලදී. ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව ඔහු විසින් ඡන්ද පත්‍රිකා ලියුම් කවරය තුළ බහාලන ලද අතර මා සහ ඡන්දදායකයා ඉදිරිපිට දී ලියුම් කවරය මුද්‍රා තබන ලදී.

ඉහත දැක්වෙන අනන්‍යතා ප්‍රකාශය ඡන්දදායකයා විසින් ඡන්දය දීමට පෙරාතුව මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

** මා පෞද්ගලිකව හඳුනන ඉහත නම් සඳහන් තැනැත්තා විසින් ඉහත සඳහන් ඡන්ද පත්‍රිකාව සහ ලියුම් කවරය මට පෙන්වූ අතර ඉහත දැක්වෙන ප්‍රකාශය මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

..............................................
සාක්ෂිකරුගේ අත්සන සහ නිල නාමය.

දිනය සහ නිල මුද්‍රාව :............................

(මේ ආකෘතියේ පිටිපස ඇති උපදෙස් බලන්න)

* අදාළ නොවන්නේ නම් කපා හරින්න.

** ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන තම නිල නාමය හා ලිපිනය යටතේ කෙළින්ම යවනු ලැබූ ඡන්දදායකයන් සම්බන්ධයෙන් පමණක් අදාළ වන අතර අදාළ නොවන්නේ නම් කපා හරිනු ලැබිය යුතු ය. ඒ ඡන්දදායකයන් පිළිබඳ ප්‍රකාශයට සාක්ෂි දැරීම පසු පිටුවේ උපදෙස්වල නියම කර ඇති පරිදි විය යුතු ය.

## ආකෘතියේ පිටුපස

අ. තම සහතික කිරීමේ නිලධරයා භාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයාට උපදෙස්.

1. තම සහතික කිරීමේ නිලධරයා භාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයා විසින්, ප්‍රකාශය අත්සන් කිරීමට පෙර—

(i) ඒ නිලධරයා භාරයේ ඡන්දදායකයා වෙත එවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඡන්ද පත්‍රිකාව බහාලූ ලියුම් කවරය ;

(ii) අනන්‍යතා ප්‍රකාශයෙහි නිශ්චිත වශයෙන් දක්වා ඇති, ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය ඔහු වෙත භාර දෙන ලද ඡන්ද පත්‍රිකාවේ දැක්වෙන අංකය ම බව

දැක බලා ගත යුතු ය.

ඉන්පසු ඡන්දදායකයා විසින් තමා සාක්ෂිකරු වශයෙන් ක්‍රියා කළ යුතු යම් නිලධරයකු ඉදිරිපිට දී ප්‍රකාශය අත්සන් කළ යුතු ය.

2. ඡන්දදායකයාට එක ඡන්දයක් පමණක් ඇත්තේ ය.

3. ඡන්දදායකයා තමා ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම සහ ලකුණ ඉදිරියෙන්, ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ තම කාර්ය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි කතිර ලකුණක් (මෙසේ X) යෙදීමෙන් ඡන්දය දිය යුතු ය. තවද, ඒ පක්ෂය විසින් හෝ කණ්ඩායම විසින් හෝ නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් 3 දෙනකුට නොවැඩි ගණනක් සම්බන්ධව ඡිය මනාපය දැක්වීම, ඒ එක් එක් අපේක්ෂකයා සඳහා වෙන් කර ඇති අනුක්‍රමික අංකයට අනුරූප වන අනුක්‍රමික අංකය ඇතුළත්, ඡන්ද පත්‍රිකාවේ පහළ ඇති කොටුවෙහි කතිර ලකුණ යෙදීමෙන් කරනු ලැබිය හැකි ය.

4. ඡන්දදායකයා, තමා ඡන්දය දුන්නේ කවර ආකාරයකට ද යන වග කිසිම තැනැත්තකුට දැකීමට ඉඩ නොතැබිය යුතු ය.

5. ඡන්දදායකයා විසින්, ඡන්දය දුන් විගස ම ඡන්ද පත්‍රිකාව තමා "ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යන වචන මතු පිටින් මුද්‍රණය කරනු ලැබ, සපයා ඇති කුඩා ලියුම් කවරය තම සාක්ෂිකරුගෙන් ලබා ගෙන ඒ තුළ, ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව, ඒ ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස නොපෙන්වමින් බහා ඒ ලියුම් කවරය නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ඉන් පසුව ලියුම් කවරය ඡන්දදායකයා සහ ඔහුගේ සාක්ෂිකරු ඉදිරිපිට දී මුද්‍රා තබනු ලැබිය යුතු ය.

ඉන්පසුව, ඡන්දදායකයා විසින්, සම්පූර්ණ කරන ලද තම අනන්‍යතා ප්‍රකාශය සමග මුද්‍රා තබන ලද ඡන්ද පත්‍රිකා ලියුම් කවරය, තේරීම් භාර නිලධරයා නමට අමතනු ලැබ බහා එවා ඇති අනෙක් ලොකු ලියුම් කවරය තුළ දමා, ලියුම් කවරය නොගැලවෙන සේ අලවා එය අප්‍රමාදව යැවීම සඳහා තම සාක්ෂිකරුට භාර දිය යුතු ය.

6. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමට පෙර, තේරීම් භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු යවනු ලැබුවහොත් ද, යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ අනන්‍යතා ප්‍රකාශය ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව සමග තිබුණ හොත් ද මිස ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව යථා පරිදි ආපසු යවනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ආ) ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන කෙළින් ම ස්වකීය නිල නාමය සහ ලිපිනය යටතේ යවනු ලැබුවේ යම් ඡන්දදායකයකු වෙත ද ඒ ඡන්ද දායකයාට උපදෙස්.

1. ඡන්දදායකයා විසින්, තම අනන්‍යතා ප්‍රකාශය අත්සන් කිරීමට පෙර ඒ ප්‍රකාශය තමා අත්සන් කළ යුත්තේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද ඒ තැනැත්තාට—

(අ) ඒ ප්‍රකාශයේ නිශ්චිත වශයෙන් දක්වා ඇති අංකය ම දරන ඡන්ද පත්‍රිකාව ; සහ

(ආ) ඡන්දදායකයා වෙත අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය හා ඡන්ද පත්‍රිකාව බහා එවන ලද ලියුම් කවරය

පෙන්වනු ලැබිය යුතු ය.

2. (අ) ඡන්දදායකයා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන්නේ නම්, ඒ යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරලත් නිලධරයකු විය යුතු වූ ද ;

(ආ) ඡන්දදායකයා රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන්නේ නම්, ඒ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු විය යුතු වූ, නෝ ඡන්දදායකයාට ජ්‍යෙෂ්ඨ නිලධරයකු නොමැති නම්, ඒ සේවයේ වෙනත් යම් නිලධරයකු විය යුතු වූ ද

සාක්ෂිකරුවකු ඉදිරිපිට දී ඡන්දදායකයා විසින් අනන්‍යතා ප්‍රකාශය අත්සන් කරනු ලැබිය යුතු ය.

3. ඡන්දදායකයාට එක් ඡන්දයක් පමණක් ඇත්තේ ය.

4. ඡන්දදායකයා, තමා ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම සහ ලකුණ ඉදිරියෙන්, ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ, තත් කාර්යය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි කතිර ලකුණක් (මෙසේ X) කිරීමෙන් ඡන්දය දිය යුතු ය. තවද ඒ පක්ෂය විසින් හෝ කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද අපේක්ෂකයන් 3 දෙනකුට නොවැඩි ගණනක් සම්බන්ධව සිය මනාපය දැක්වීම, ඒ එක් එක් අපේක්ෂකයා සඳහා වෙන් කර ඇති අනුක්‍රමික අංකයට අනුරූප වන අනුක්‍රමික අංකය ඇතුළත් ඡන්ද පත්‍රිකාවේ පහළ ඇති කොටුවෙහි කතිර ලකුණ යෙදීමෙන් කරනු ලැබිය හැකි ය.

5. ඡන්දදායකයා තමා ඡන්ද දුන්නේ කවර ආකාරයට ද යන වග කිසිම තැනැත්තකුට දැකීමට ඉඩ නොතැබිය යුතු ය.

6. ඡන්දදායකයා විසින්, ඡන්දය දුන් වහාම "ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යන වචන මතු පිටින් මුද්‍රණය කරනු ලැබ, ඔහු විසින් ලද කුඩා ලියුම් කවරය තුළ ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව දමා ලියුම් කවරය නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ඉන් පසුව ඡන්දදායකයා විසින්, අනන්‍යතා ප්‍රකාශය සහ මුද්‍රා තබන ලද ඡන්ද පත්‍රිකා ලියුම් කවරය, තේරීම් භාර නිලධරයා නමට අමතනු ලැබ ඔහු එවා ඇති අනෙක් ලොකු ලියුම් කවරය තුළ දමා එය අප්‍රමාදව තැපෑලෙන් යැවිය යුතු ය. ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාව වහාම ආපසු එවනු නොලැබුවහොත්, එය ගණන් කරනු ලැබීමට ප්‍රමාද වැඩි විය හැකි ය.

7. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී ඡන්දය විමසීම අවසන් කරනු ලැබීමට පෙර තේරීම් භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු යවනු ලැබුවහොත් ද යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ අනන්‍යතා ප්‍රකාශය ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව සමග තිබුණහොත් ද මිස ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව යථා පරිදි ආපසු යවනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

"ඇ" ආකෘතිය

(9 (1) වන නියෝගය)

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

මට කියවා දෙන ලද, ආඥාපනතේ උපලේඛනයේ ඇතුළත් නියෝගවල 9 වන නියෝගයේ (3) වන ඡේදය මගින් තහනම් කරනු ලැබ ඇති කිසිවක් මේ කටයුතු වල දී මා නොකරන බවට මම ගාම්භීරතා පූර්වකව හා අවංකව ප්‍රකාශ කරමි.

———,
ප්‍රකාශකයාගේ අත්සන.

---

ප්‍රකාශය කරන ලද්දේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද
ඒ තැනැත්තාගේ අත්සන.

දිනය :———.

සැලකිය යුතුය : ප්‍රකාශය කරනු ලබන්නේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද, ඒ තැනැත්තා විසින් ප්‍රකාශක වෙත මෙහි සඳහන් කර ඇති ඡේදය කියවා දෙනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

34. මේ පනත ආරම්භ වුන දිනයෙන් පසුව, ප්‍රධාන ප්‍රඥප්තියේ "මැතිවරණ නිලධාරී" හෝ "සහකාර මැතිවරණ නිලධාරී" හෝ පිළිබඳ සෑම සඳහන් කිරීමක් ම පිළිවෙළින් ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක් තුළද ඒ දිස්ත්‍රික්කය සඳහා 4 වන වගන්තිය යටතේ පත් කරන ලද තේරීම් භාර නිලධරයා සහ ඒ ඡන්ද විමසීම් ප්‍රදේශය පිහිටා ඇති දිස්ත්‍රික්කය සඳහා ඒ වගන්තිය යටතේ පත් කරන ලද සහකාර තේරීම් භාර නිලධරයා ලෙස කියවා තේරුම් ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.